රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 29/2011

මගේ අංකය:EST-9/DICIP/06/0166
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
2011. 12.21 දින

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

**ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ 24:3 උපවගන්තිය යටතේ වූදිත නිලධාරියා විධිමත් විනය පරීක්ෂණයේදී වරදකරු වන අවස්ථාවේ දඬුවම් පැනවීම**

ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ 24:3 උපවගන්තිය කෙරේ ඔබගේ අවධානය යොමු කරවමි. එම උපවගන්තියට පහත සඳහන් උපවගන්ති එකතුකර සංශෝධනය කිරීමට 2011.11.09 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇත.

24:3:14 වූදිත නිලධාරියා විධිමත් විනය පරීක්ෂණයේ වරදකරු වන අවස්ථාවකදී, ඔහුට විනය නියෝගයක් වශයෙන් පනවනු ලබන 24:3:1 හෝ 24:3:2 හෝ සඳහන් දඬුවම් හැර 24:3:3 සිට 24:3:13 වගන්ති වලට අදාළ දඬුවම් ක්‍රියාත්මක කිරීමේදී, වාරික 24 කට නොවැඩි වාරික ගණනකින් අයකර ගත යුතු වන සේ, රු.30,000/- ක මුදලක් වූදිත නිලධාරියාගෙන් අයකර ගැනීම.

24:3:15 විනය නියෝගයකට එරෙහිව අභියාචනා ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 24:3:1 හා 24:3:2 ට අදාළ වන වූදිත නිලධාරින් දඬුවමක්ද සමඟ නැවත රාජ්‍ය සේවයේ පිහිටුවහොත් හෝ විශ්‍රාම ගැන්වුවහොත් ඉහත 24:3:14 හි සඳහන් රු.30,000/- ක මුදල අයකර ගැනීම.

පී.බී.අබේකෝන්,
ලේකම්,
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය